# ධනපතියා හා ලාසරස් පිලිබඳ උපමාව




පරිවර්තනය - www.subaasna.com


ජේසුස් වහන්සේ දැනගෙන හිටිය සමහරු දෙවියන් වහන්සේට
වඩා සල්ලි වලට ආදරේ කරන බව
දිනක් ජේසුස් වහන්සේ මිනිසුන් දෙදෙනෙකු ගෙන උපමාවක්
මගින්  කථා කරලා කිව්වා දෙවිදුන් නැතිව සල්ලි විතරක්
හොයන එකේ විපාකය
මුදල් වලට මරණින් පසු ස්වර්ගීය දොරටු විවෘත
කරන්න බැහැ කියල ජේසු මේ මගින් කියා දුන්නා
8.1



එක කාලයක හිටියා හොදට සල්ලි
තියෙන , ගොඩක් වටිනා ඇදුම් අදින
රජෙක් වගේ සල්ලි තියෙන කෙනෙක්
8.2

ඒ මිනිසාට හොදට කෑම බීම පවා තිබ්බා. කොච්චර සල්ලි තිබ්බද කියනවනම්
තමන්ට කන්න ඕනි ඕනිම දෙයක් මිලදී ගන්න තරම් ඔහුට සල්ලි තිබ්බා



8.3

මේ අතර ඒ සල්ලි තියෙන පුද්ගලයාගේ ගෙදර දොරටුව ලඟ ඉතා දුප්පත් ,
කන්න හරිහමන් කෑමක් නැති, අදින්න හරිහමන් ඇදුමක් නැති දුප්පත් අයෙක් හිටියා.
එයාගේ නම ලාසරස්



8.4


මේ දුප්පත් ලාසරස් ඉතා දුක් සහිත
ජීවිතයක් ගත කලේ. ඔහුට ගොඩක්
ලෙඩ දුක් පවා තිබ්බා. තමන්ට සල්ලි
නැති නිසා මේ ලාසරස් ගත කලේ
ගොඩක් දුක් සහිත ජීවිතයක්.
8.5


අර පොහොසත් මනුස්සයාගේ
මේසෙන් වැටෙන කෑම කැබලි
වලින් තමයි මේ දුප්පත්
ලාසරස් ගොඩක් වෙලාවට
කුසගින්න නිවා ගත්තේ.
8.6

සමහර වෙලාවට
බල්ලෝ පවා මේ
මනුස්සයාගේ තුවාල
ලෙව කෑවා. ඒ වගේ
දුක් සහිත ජීවිතයක්
ඔහු ගත කලේ.




එක් දිනක් උදෑසන
ලාසරස් නින්දෙන්
අවදි වුනේ නැහැ.
මිනිස්සු බලද්දී මේ
දුප්පත් ලාසරස්
මරණයට පත්වෙලා.




මරණීන් පසු මේ දුප්පත් ලාසරස්
දේව දුතයින් විසින් ස්වර්ගයට ගෙන ගියා.
8.9


මේ අතර අර පොහොසත් මනුස්සයත් මිය ගියා.
ඔහුගේ සල්ලි වලට ඔහුව බේර ගන්න බැරි උනා.
8.10

මේ පොහොසත් මනුස්සයවත් භූමදාන කළා. ලොකු අවමංගල්‍ය උත්සවයකුත් පැවැත්තුවා. එහිදී ගොඩක් දෙනා ඔහුගේ ජීවිතය ගැන කථා කළා. නමුත් අවසානයේ ඔහුට සදාකාලික ගින්න එනම් අපායට යන්නට සිදු වුනා.




ඔහු එහි සිට කෑ ගසා මෙසේ කිව්වා ආබ්‍රහම් පිය තුමෙනි, මට කරුණා කොට, තම ඇඟිලි තුඩ දියේ ගල්වා, මාගේ දිව තෙමාලන පිණිස ලාසරස් එවනු මැනව මන්ද, මම මේ ගිනි ජාලාවෙහි දහ දුක් විඳිමියි කියල




එව්ට ආබ්‍රහම් පිළිතුරු දෙමින් මෙසේ කිව්වා
පුත්‍රය, ඔබ ජීවත් ව සිටිය දී, හැම සැපත ම ඔබට
තිබුණු බව ද එලෙස ම හැම විපත ම ලාසරස්ට
තිබුණු බව ද සිහි කරන්න.
එහෙත් දැන් ඔහු මෙහි සැනසිලි ලබයි
ඔබ දහ දුක් විඳින්නෙහි ය.
එපමණකුත් නොවේ, මොබින් ඔබ වෙත යාමට වත්
ඔබින් අප වෙත ඒමට වත් කැමැති වූවන්ට එය
කළ නොහැකි වන සේ ඔබ හා අප හා අතර
පරතරයක් පිහිටුවා ඇතැයි කියා.
8.13


එව්ට මේ මිනිසා මෙහෙම කිව්වා එසේ නම් පිය තුමෙනි,
මාගේ සහෝදරයෝ පස් දෙනෙක් සිටිති ඔවුන් ද මේ වධ
වේදනා ඇති ස්ථානයට නොපැමිණෙන පිණිස,
ඔවුන්ට අවවාද දෙන්නට ලාසරස් මාගේ පියාගේ ගෙදරට
යවන මෙන් ඉල්ලමියි කියල.
8.14

ආබ්‍රහම් පිළිතුරු දෙමින් මෙසේ කිව්වා මෝසෙස්
සහ දිවැසිවරයෝ ඔවුන්ට සිටිති.
ඔව්හු ඔවුන්ට සවන් දෙත් වායි කියා.




මේ උපමාව මගින් ජේසු කියා දුන්නා අපි අනිත් අයගේ
දුකේදී , ඕනෑකමේදී අපි උපරිමයෙන්ම උදව් උපකාර
වෙන්න ඕනි කියන දේ. නැතිනම් අපිටත් වෙන්නේ
මරණීන් පසු මේ පොහොසත් මනුස්සයාට උන දේ තමයි.

